WORKED

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,573 — 1958 ඔක්තෝබර් 31 වැනි සිකුරාද — 31.10.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV වැනි කොටස—පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 897 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අය වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | 901 |
| අතුරු ව්‍යවස්ථා ... ... | 897 | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 902 |


## පළාත් පාලන නිවේදන

### උඩපළාත—ගඟඉහළ ගම්කාර්‍ය සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

1951 මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ අංක 2 දරණ සංශෝධිත පණතේ 13 (ඒ) 1 දරණ ඡේදයෙන් මාවෙත බලය පැවරෙන ලද පරිදි නියමිත අධිකාරී තැනවූද, මහනුවර දිස්ත්‍රික්කයේ උඩ පලාත ගග ඉහළ ගම්කාර්‍ය සභාවේ සභාපති තැනවූද ඇම්. ඇස්. අලුත්ගමගේ වන මම 1959 ජනවාරි 1 වැනි දින සිට දෙසැම්බර් 31 වැනි දින අතර කාලය තුළ ගඟඉහළ ගම්කාර්‍ය සභා ප්‍රදේශ සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළඳාම සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

ඇම්. ඇස්. අලුත්ගමගේ,
සභාපතිතැන.

1958, ඔක්තෝබර් මස 8 දින,
මීතලාව, ගම්කාර්‍යසභා කාර්‍යාලයේ දිය.

---

### 1952 කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥාපනත

1952 කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වෙනි වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පනාවල් කෝරළයේ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්මත කරගන්නා ලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පහත පල කරනු ලැබේ.

#### යෝජනාව

පළාත් පාලනය පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරණ ලද්දාවූ සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් සම්මත කරණ ලද බව 1953 අගෝස්තු මස 7 වෙනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පලවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූ පොදු අතුරු ව්‍යවස්ථා වල 1, 2. 3, 4, 5, 6, 7, 8, 9, 10, 11, 12, 13, 14, 15, 16, 17, 18, 19, 20, 21, 22, 23, 24, 25, 26, 27, 28, 29, 30, 31, 32, 33, 34, 35, 36, සහ 37 වැනි කාණ්ඩයන් මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පලවනද සිට සම්මත කරගැනීමට පනාවල් කෝරලයේ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් 1952 කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

ඩී. ඩී. පෙරේරා,
පනාවල් කෝරලේ ගම්කාර්‍ය සභාවේ ප්‍රධාන තැන.

වෂී 1958 ක්වූ ඔක්තෝබර් මස 6 වැනි දින,
පනාවල් කෝරළයේ ගම්සභා කාර්‍යාලයේදිය.

---

## අතුරු ව්‍යවස්ථා

ජීවී 14/2/6.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් (3) වෙනි උප වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්යංශයේ ස්ථාවර ලේකම්තැන.

1958 ඔක්තෝබර් මස 13 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

1958 මේ මැයි මස 16 වැනි දින අංක 11,314 දරන ගැසට් පත්‍රයේ පළවූ ආයුර්වේද බෙහෙත් ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, එහි 7 වැනි අතුරු ව්‍යවස්ථාව අත්හැර දැමීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

---

ජී. පී. 14/21/7.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ වැසිහේන ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ සථාවර ලේකම් තැන.

### රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා

1. (1) ආඥාපනතේ 47 වෙනි වගන්තිය යටතේ අය කරණු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත් වූ යම් රථවාහනයක් හෝ සතුන් අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබා ගෙන හෝ සිටින්නාවූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මීට යාකොට ඇති “ ඒ ” උපලේඛනයේ සඳහන් පෝරමයේ ප්‍රකාර විස්තර උපලේඛනයක් ප්‍රධාන තුමාට සැපයිය යුතුයි. මේ පෝරම ගම්කාර්‍ය සභා කාර්‍යාලයෙන් ලබාගත හැකිය.

(2) ආඥාපනතේ 47 වෙනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින් 1959 වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනය සම්පූර්ණ කොට 1959 ජනවාරි මස 31 වෙනි දින හෝ ඊට මත්තෙන් හෝ ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් වත් එකී අයගෙන් එබඳු උපලේඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම තවදුරටත් දැනුම් දෙනු ලැබීමක් නැතිව—

(අ) “ ඒ ” උපලේඛනයේ සඳහන් රථවාහන සහ සතුන් සඳහාවූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු 31 වෙනිදට හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති ; තවද

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් කරන ලදුව, එකී වර්ෂයේ දවස් 30 කට වැඩි කාලයක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන හෝ සතුන් සඳහාවූ බද්ද, එකී එක් එක් අවුරුද්දේ මාර්තු 31 වෙනිදට හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාට පසු යම් කිසිවකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූද ආඥාපනත යටතේ බද්දට යටත්වූද යම් රථවාහනයක් හෝ සතකු අත්පත් කරගෙන තබා ගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එක්කෝ 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථවාහනයක් හෝ සතකු පළමුවන වරට අත්පත් කරගෙන තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේනම් එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහනයක් හෝ සතකු අත්පත් කර ගැනීමේ හෝ තබා ගැනීමට නොහොත් පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක මාසයක් ඇතුළතදී සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් “ ඒ ” උපලේඛනයේ සඳහන් පෝරමයේ ප්‍රකාරයට ලියවිල්ලකින් වූ දැන්වීමකින් එසේ අත්පත් කරගත් බව ප්‍රධාන තුමාට දැනුම්දිය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන් ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන්ද එකී ලේඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ රථවාහන හෝ සතුන් සඳහාවූ බද්ද ඒ සඳහා ප්‍රධාන තුමා විසින් තමාට දැනුම් දෙනු ලබන යම් කාල සීමාවක් ඇතුළතදී ගෙවීමට බැඳී සිටිති.

5. (1) (1) වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ උපලේඛනයට ඇතුළත් කළාවූ හෝ ලේඛනයේ සඳහන් කළාවූ යම් රථවාහනයක් හෝ සතකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින් ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් අසවල් හේතූන් නිසායයි දැක්වෙන ලියවිල්ලකින්වූ දැන්වීමක් වහාම ප්‍රධාන තුමා වෙත එවිය යුතුයි.

(2) (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ රථවාහනය හෝ සතා තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම අත්හැරියාවූ සෑම අයකු විසින්ම ලියවිල්ලකින්වූ දැන්වීමකින් තමා ඒ සතා හෝ රථවාහනය තබාගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව හෝ ඒ ගැන අයිතිවාසිකම් අත්හල බව වහාම ප්‍රධාන තුමා වෙත දැනුම් දිය යුතුයි.

6. යම් කිසිවෙකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධාන තුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහනය වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් “ බී ” උපලේඛනයේ ප්‍රකාරයට ඒ ඒ රථවාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරුද තහඩුව නිකුත් කරන අවුරුද්ද දැක්වෙන ඉලක්කම්ද රථවාහන රෙජිස්ටරයේ ඒ ඒ රථවාහනය පිළිබඳවූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙන යම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙනොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් එය ප්‍රධානතුමාට ආපසු භාරදිය යුතුයි. තවද ඔහු විසින් ශත පණහක් ගෙවූ විට ඔහුට අලුත් තහඩුවක් නැවත ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරාගෙන තිබෙන බව දිව්රුම් සහතිකයකින් හෝ වෙන යම් ලෙසකින් ප්‍රධාන තුමාට ඒත්තු ගැනීමට සැලැස්වුවහොත් එතුමා අයිතිකාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් ශත හැටක් ගෙවනු ලැබූ විටත් අලුත් තහඩුවක් නිකුත් කළ හැකියි.

7. සෑම රථවාහනයක අයිතිකරු විසින් හෝ භාරකරු විසින්, 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව, ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවි කළ යුතුයි.

8. ප්‍රධාන තුමා විසින් හෝ ආදායම් ඕවර්සියර් වරයෙකු විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ ප්‍රධාන තුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනා ගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක්, ඒ රථවාහනයෙහි 7 වෙනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර සවිකොට තැබිය යුතු තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේය. තවද ප්‍රධාන තුමා විසින් හෝ ආදායම් ඕවර්සියර්වරයා විසින් හෝ පොලිස් නිලධාරියා විසින් හෝ වෙනත් එබඳු නිලධාරියකු විසින් හෝ ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම රථයක භාරකාරයා විසින් හෝ ඒ රථය පදවන්නා විසින් හෝ ඒ රථය නවත්වා ප්‍රධාන තුමාට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්ෂා කර බැලීමට ඉඩදිය යුතුයි.

9. කාර්‍ය සභාව විසින් සම්පාදිතව 1941කෝ අගෝස්තු මස 1 වැනි දින අංක 8,776 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගු කරනු ලැබේ.

10. මේ අතුරු ව්‍යවස්ථාවල—

“ ප්‍රධාන තුමා ” යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ.

“ කාර්‍ය සභාව ” යනුවෙන් ගාලු දිස්ත්‍රික්කයේ වැසිහේන ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ.

“ ආඥාපනත ” යනුවෙන් ගම්කාර්‍ය සභා ආඥාපනත (198 වෙනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

### “ ඒ ” උපලේඛනය

පෝරමය

අංකය..............

ඡන්දදායක කොට්ඨාශ අංකය..............

මැසිහේන ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාරයට සැපයිය යුතු රථවාහන හා/හෝ *, සතුන් පිළිබඳ ලේඛන යයි.

අයිතිකාරයාගේ නම :————.

ගම :————.

| රථවාහන හා /හෝ* සතුන් පිළිබඳ විස්තර | ගණන (වචන වලින්) | වෙනත් විස්තර බයිසිකලයක් නම් වර්ගය සහ නොම්මරය |
| --- | --- | --- |
| කරත්ත, තිරික්කල හෝ ජින්රික්ෂෝ කරත්ත හැර ඕනෑම අන්දමක වාහන... | | |
| ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල ... ... | | |
| තනි ගොනා බඳින බර බාග කරත්ත හෝ තිරික්කල ... ... | | |
| අත් කරත්ත ජින් රික්ෂෝ කරත්ත ... | | |
| බයිසිකල් ... ... | | |
| අලි .... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

මගේ දැනීමේ හැටියට, ඉහත සඳහන් ලේඛනය නිවැරදි බැව් සහතික කරමි.

————,
අයිතිකරුගේ/හෝ හිමිකාරයාගේ හෝ භාරකරුගේ අත්සන.

දිනය :————.

* නොවුමනා වචන කපා හරින්න.

"බී" උපලේඛනය

සෑම ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කල යක් සඳහා ... ... ... වැ.බ.ක.

තනිගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කල යක් සඳහා ... ... ... වැ.ත.ක.

සෑම ජින් රික්ෂෝ කරත්තයක් සඳහා ... ... වැ.රි. ක.

සෑම අත් කරත්තයක් සඳහා ... ... වැ.අ. ක.

සෑම බයිසිකලයක් සඳහා ... ... වැ.කා.බි.

ජීබී 14/36/7.

ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ කැකනදුර ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරීතිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමතකරනලද අතුරුව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යකාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

වර්ෂ 1958ක් වූ ......... මස ...............
වෙනි දින කොළඹදීය.

රෙදි පිරිසිදුකිරීමේ ස්ථාන සම්බන්ධයෙන් වූ අතුරුව්‍යවස්ථා

1. (1) සෞඛ්‍යය පිළිබඳ වෛද්‍යනිලධාරිතුමාගේ නිර්දේශය පරිදි ඒ සඳහා ප්‍රධානතුමා විසින් නිකුත්කරනුලබන බලපත්‍රයක් පිට මිස නැත්නම් කිසිවෙකු විසින් රෙදි පිරිසිදු කිරීමේ ස්ථානයක් පිහිටුවීම හෝ පවත්වාගනයෑම හෝ නොකළයුතුයි.

(2) වැනි ඡේදය යටතේ නිකුත් කරනලද සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද අවුරුද්දේ දෙසැම්බර මස තිස් එක්වැනි දාට අවසාන වන්නේය.

(3) බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම කාර්‍ය සභාව විසින් ඒ සඳහා සපයා ඇති ෆෝරමයේ ප්‍රකාරයට සකස් විය යුතුවාත් හැර—

(අ) අළුත් බලපත්‍රයක් සම්බන්ධයෙන් නම් එම බලපත්‍රය පිරිසිදු කිරීමේ ව්‍යාපාරය පටන් ගැනීමේ දිනට නොඅඩු තිස් දිනකට කලින්, හා

(ආ) දැනට තිබෙන බලපත්‍රයක් අළුත් කිරීම පිළිබඳ සම්බන්ධයෙන් නම් බලපත්‍රය අවශ්‍ය අවුරුද්දට කලින් අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ පහළොස් වැනි දිනට හෝ ඊට මත්තෙන් ප්‍රධාන තුමා වෙත ඉදිරිපත් කළ යුතුද වන්නේ ය.

2. සුදුසුවූ සෑම කල්හිම ප්‍රධානතුමාට හෝ ප්‍රධානතුමාගෙන් විධිවූ පරිදි ලියවිල්ලකින් බලයලත් කාර්‍යසභාවේ වෙනයම් ඕනෑම නිලධාරියෙකුට හෝ රෙදිපිරිසිදු කරන ස්ථානයට ඇතුල්ව රෙදිපිරිසිදු කිරීමේ කටයුතුවලට පාවිච්චිකරනුලබන ලිඛඩු, උපකරණ, වාහන හෝ වෙනත් උවමනා ද්‍රව්‍ය පරීක්ෂාකිරීම නීත්‍යානුකූල වන්නේය.

3. රෙදි පිරිසිදුකිරීම සඳහා පාවිච්චි කරන ස්ථානය පහත සඳහන් නියමයන්ට අනුකූලව නොමැතිනම් කිසිවෙකු විසින් එවැනි ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම නොකළයුතුය :—

(අ) ස්ථානය හොඳට සාදාතිබියයුතුවාක් හැර එය ඇතුලට හොඳට හුලං වැදෙනලෙසත් හොඳට එළිය වැටෙනලෙසත් සහ ගොඩනැගිල්ලේ සෑම කාමරයකම විවෘත කළහැකි ජනේල තිබිය යුතුය. තවද ඒ ජනේල විවෘත කළ විට ඒ විවෘතව පවත්නාකොටස මතුපිට තිබියයුතුය. තවද ඒ ජනේල විවෘතකල විට ඒ විවෘතව පවත්නාකොටස මතුපිට බිමෙන් පහළොහෙන් එක පංගුවකට අඩුනොවිය යුතුයි.

(ආ) ඒ ගොඩනැගිල්ලේ සෑම කාමරයකම බිත්ති උසින් අඩි හතකට නොඅඩුව එහි ඇතුලත හුනුබදාමෙන් කපලාරුකර සුදුහුනු ගා තිබිය යුතුයි.

(ඉ) ප්‍රධානතුමා විසින් අනුමතකරනුලැබූ වැවක, පොකුනක, හෝ එසේ නැත්නම් ළිඳක රෙදි සෝදනවිට හැර රෙදිඇපිල්ලීමේ කටයුතු සඳහා ඒ ස්ථානයෙහි සෑහෙන ජල සම්පාදනයක් තිබියයුතුයි.

(ඊ) කිලිටු රෙදි සහ සෝදන ලද රෙදි ගබඩා කිරීම සඳහා වෙන් වෙන් වශයෙන් කාමර තිබියයුතුවාත් හැර ඒවායේ බිම සිමෙන්තියෙන් සාදා තිබිය යුතුයි.

(උ) රෙදි පිරිසිදුකිරීමේ ස්ථානයෙහි රක්ෂාවේ යොදවාගෙන ලැබ සිටින මෙහෙකරුවන් දහදෙනෙකුට එක් වැසිකිළියක් බැගින් ඒ ස්ථානයෙහි වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුයි.

4. රෙදි පිරිසිදුකිරීමේ ස්ථානයක් පිහිටුවා තිබෙන සෑම අයෙකු විසින්ම ඒ ස්ථානයේ සෑම කොටසක්ම සහ ඒ අවට, එහි ඇති කානු සහ එහි කටයුතුවලට පාවිච්චිකරනුලබන ලිඛඩු, උපකරන, සහ වෙනත් ද්‍රව්‍ය පිරිසිදුව සහ හොඳ තත්වයෙන් තබාගතයුතුයි.

5. බෝවෙන රෝගයකින් හෝ සමේරෝගයකින් පෙළෙන්නාවූ හෝ වසංගත රෝගයකින් ලඟදී පෙළුනාවූ හෝ එබඳු රෝගයකින් පෙළෙනකෙනෙකුට සාත්තුකිරීමේ හෝ යෙදිසිටියාවූ කිසිම කෙනෙකුට එකී රෝගය බෝවීමට හා රොගබීජයන් මෝරනුලැබීමට ගතවන කාලසීමාවත් පසුවනතෙක් රෙදි පිරිසිදු කිරීමේ ස්ථානයට ඇතුල් වීමට හෝ එහි වැඩකටයුතුවල යෙදීමට හෝ එසේ නැත්නම් ඒ ස්ථානයට කිසියම් බඩුබාහිරාදියක් ගෙනඒමට හෝ ඒ ස්ථානයෙන් පිටත ගෙනයෑමට රෙදි පිරිසිදුකිරීමේ ස්ථාන පිහිටුවා ඇති කිසිවෙකු විසින් ඉඩනොදියයුතුයි.

6. රෙදි පිරිසිදුකිරීමේ ස්ථානයක් පිහිටුවා ඇති සෑම අයෙකු විසින්ම ප්‍රධානතුමා හෝ ප්‍රදේශයේ සෞඛ්‍යකටයුතු පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමා විසින් හෝ නියමකරනුලබන අන්දමට විසබීජනාශක ද්‍රව්‍ය නොයෙදූ කිළිටු රෙදිපිළි ආදියත් බෝවෙන හෝ වසංගතරෝගයක් ලඟදී පැවතුනාවූ හෝ දැනට පවතින්නාවූ කිසිම ගෙදරකින් ලබාගැනීම හෝ බාරගැනීම හෝ එසේ නැත්නම් ලබාගැනීමට හෝ බාර ගැනීමට සැලැස්වීම නොකළයුතුයි.

7. රෙදි පිරිසිදුකිරීමේ ස්ථානයක් පිහිටුවා ඇති සෑම අයෙකු විසින්ම එහි බෝවෙන හෝ වසංගත රෝගයක් හටගත් කෙනෙහිම——

(අ) එහි වැඩකටයුතු වහා නැවැත්විය යුතුයි.

(ආ) එම රෝගය හටගත් බැව් ප්‍රධානතුමාට දැන්වියයුතුයි.

(ඉ) රෙදිපිළි ලබාගත් අයවළුන්ට ඒවා ආපසු බාරදීම සඳහා ප්‍රධානතුමාගෙන් ලියවිල්ලකින් බලය ලබාගන්නාතුරු එම රෙදිපිළි තමා භාරයේ තබාගතයුතුයි.

(ඊ) එම ස්ථානය රෝගබෝවීමෙන් තුරන්වී ඇති බවට ප්‍රධානතුමා විසින් ප්‍රකාශකරනතුරු එහි වැඩකටයුතු නැවත පටන් නොගතයුතුයි.

8. රෙදි පිරිසිදුකිරීමේ ස්ථානයක් පවත්වනුලබන සෑම අයෙකු විසින්ම නිදනකාමරයක් සේ පාවිච්චි කරන කිසියම් කාමරයක කිලිටු රෙදි හෝ සෝදනු ලැබූ රෙදි නො තැබිය යුතුයි.

9. මේ අතුරුව්‍යවස්ථාවල :—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍යසභාවේ ප්‍රධානතුමා අදහස්කරනු ලැබේ.

"කාර්‍යසභාව" යනුවෙන් මාතර දිස්ත්‍රික්කයේ කැකනදුර ගම් ප්‍රදේශයේ ගම්කාර්‍යසභාව අදහස් කරනු ලැබේ.

ඇල් ජී. බී.—ජී.සී 14/12.

**ගම්සභා ආඥාපනත**

ගම්සභා ආඥාපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ බෝයගනේ ගම් ප්‍රදේශයේ ගම් කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ "ගැසට් අතිරේකයේ" පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරණ ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ.

අතුරු ව්‍යවස්ථා

**ගොඩනැගිලි හා තාප්ප තැනීම**

1. (i) කිසිවකු විසින් ගම් ප්‍රදේශය තුළ—

(ඒ) ඕනෑම ගම්බද කරත්ත පාරක් මැද සිට අඩි දහ අටක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(බී) යථා කාලයේදී ගම්බද කරත්ත පාරක් බවට පත් කරනු ලැබිය හැකි යයි ගම්කාර්ය සභාව විසින් දැනුම් දෙනු ලැබුවාවූ ඕනෑම අඩිපාරක් මැද සිට අඩි දහ අටක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(සී) (බී) උප ඡේදයේ සඳහන් කරන ලද අඩි පාරකින් බාහිර වූ ඕනෑම ගම්බද අඩි පාරක් හෝ දෙවට පාරක් මැද සිට අඩි හතක දුර ප්‍රමාණයක් ඇතුළත අළුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදිය යුතු නැත.

(ii) කිසිවකු විසින් ලියවිල්ලකින්වූ දැන්වීමකින් දවස් තිහකට කලින් ඒ පිළිබඳව ප්‍රධාන තුමාට දැනුම් නොදී මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වෙනි ඡේදයේ සඳහන් කරන ලද ඕනෑම කරත්ත පාරක් හෝ අඩිපාරක් හෝ දෙවට පාරක් අයිනේ කිසිම ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදිය යුතු නැත.

**රථවාහන හා සතුන් පිළිබඳ බද්ද**

2. (1) ආඥාපනතේ 47 වෙනි වගන්තිය යටතේ අය කරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත්වූ යම් රථවාහනයක් හෝ සතෙකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබා ගෙන හෝ සිටින්නාවූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් කොට ඇති "ඒ" උපලේඛනයේ සඳහන් ෆෝරමයේ ප්‍රකාර විස්තර උපලේඛනයක්, සභාපතිතුමාට සැපයිය යුතුයි. මේ ෆෝරම ගම්කාර්ය සභා කාර්යාලයෙන් ලබාගත හැකිය.

(2) ආඥාපනතේ 47 වෙනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින්, 1959 වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනය සම්පූර්ණ කොට 1958 දෙසැම්බර් මස තිස් එක්වෙනි දිනට හෝ ඊට මත්තෙන් ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් වත් එකී අය ගෙන් එබඳු උප ලේඛනයක් අවශ්‍ය නැත.

3. ආඥාපනතේ 47 (2) වෙනි වගන්තියේ විධි විධාන වලට යටත්ව 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවා වූ සෑම අයෙක්ම තව දුරටත් දැනුම් දෙනු ලැබීමක් නැතිව—

(අ) ඒ උපලේඛනයේ සඳහන් රථවාහන හා සතුන් සඳහා වූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු මස තිස් එක්වෙනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති, තවද,

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන හා සතුන් සඳහා වූ බද්ද, එකී එක් එක් අවුරුද්දේ මාර්තු මස තිස් එක්වෙනිදාට හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

4. 2 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාට පසු යම් කිසිවෙකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූ ද ආඥාපනත යටතේ බද්දට යටත්වූද යම් රථ වාහනයක් හෝ සතෙකු අත්පත් කර ගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් හෝ 2 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථ වාහනයක් හෝ සතෙකු පළමුවන වරට අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම්, එවිට ඒ අය විසින් එබඳු යම් රථ වාහනයක් හෝ සතෙකු හෝ අත්පත් කර ගැනීමේ හෝ තබා ගැනීමට නොහොත් පාවිච්චි කිරීමට හෝ පටන් ගැනීමේ දින සිට එක මාසයක් ඇතුළතදී සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් කොට ඇති "ඒ" උප ලේඛනයේ සඳහන් ෆෝරමයේ ප්‍රකාරයට ලියවිල්ලකින්වූ දැන්වීම කින් එසේ අත්පත් කරගත් බව ප්‍රධාන තුමාට දැන්විය යුතුයි.

5. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධි විධාන වලට යටත්ව 4 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයූවාවූ සෑම අයෙක්ම, එකී ලේඛන සැපයූ අවුරුද්ද වෙනුවෙන් ද ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන් ද එකී ලේඛනයේ සඳහන් කරන ලැබූ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනයේ පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් සඳහා බද්ද, ඒ සඳහා ප්‍රධානතුමා විසින් තමාට දැනුම් දෙනු ලබන යම් කාලසීමාවක් තුළදී ගෙවීමට බැඳී සිටිති.

6. (1) 2 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 4 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියකියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ උපලේඛනයට ඇතුළත් කළාවූ හෝ ලේඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47 (3) වෙනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින් එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් අසවල් හේතු නිසා යැයි දක්වෙන ලියකියවිල්ලකින් වූ දැන්වීමක් වහාම ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි.

(2) 2 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය හෝ 4 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලිය කියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ රථවාහනය හෝ සතා තබා ගැනීමට හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියාවූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින් වූ දැන්වීමක්, තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම හෝ නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අත්හල බව වහාම ප්‍රධාන තුමා වෙත ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

7. යම්කිසි වෙකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධානතුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහනය වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් කොට ඇති "බී" උපලේඛනයේ ප්‍රකාරයට ඒ ඒ රථවාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරුද, තහඩුව නිකුත් කරන අවුරුද්ද දක්වෙන ඉලක්කම්ද, රථවාහන රෙජිස්ටරයේ ඒ ඒ රථ වාහන පිළිබඳවූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙනහොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් ප්‍රධානතුමාට ආපසු භාරදිය යුතුයි. තවද ඔහු විසින් ශත පණහක් ගෙවූ විට ඔහුට අළුත් තහඩුවක් ලබාගැනීමට අයිතිවාසිකම තිබේ.

8. සෑම රථවාහනයකම අයිතිකරු විසින් හෝ භාරකරු විසින්, 7 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව, ඒ රථවාහනයේ කාටත් පෙණෙන තැනක සවි කළ යුතුයි.

9. ප්‍රධානතුමා විසින් හෝ එතුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම් මාවතක හෝ පාරක ගමනා ගමනයෙහි යෙදී තිබෙන රථ වාහනයක්, ඒ රථවාහනයෙහි 8 වෙනි අතුරු ව්‍යවස්ථාවෙහි ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේය. තවද ප්‍රධානතුමා විසින් හෝ නිලධාරියා විසින් ඉල්ලීමක් කර සිටිය කල්හි එකී ඕනෑම රථයක භාරකාරයා විසින් හෝ ඒ රථය පදවන්නා විසින් හෝ ඒ රථය නවත්වා ප්‍රධානතුමාට හෝ එකී නිලධාරියාට හෝ එකී තහඩුව පරීක්ෂාකර බැලීමට ඉඩදිය යුතුයි.

10. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ගම්බද කරත්ත පාර" යනුවෙන් කාර්ය සභාව විසින් නඩත්තු කරගෙන යනු ලබන්නාවූද, පළල අඩි නවයකට අඩු නොවන්නාවූද පාරක් අදහස් කරනු ලැබේ.

"ගම්බද අඩි පාර" හෝ "දෙවට පාර" යනුවෙන් කාර්ය සභාව විසින් නඩත්තු කරගෙන යනු ලබන්නාවූද, පළල අඩි නවයකට අඩු වන්නාවූද එහෙත් අඩි හයකට අඩු නොවන්නාවූද පාරක් අදහස් කරනු ලැබේ.

"ප්‍රධාන තුමා" යනුවෙන් කාර්ය සභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ.

"කාර්ය සභාව" යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ බෝයගනේ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ.

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත (198 වෙනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

"ගම් ප්‍රදේශය" යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ බෝයගනේ ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

11. 1941 ජනවාරි 31 වෙනි දින අංක 8,507 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධවූ අතුරු ව්‍යවස්ථා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ බෝයගනේ ගම්කාර්ය සභා ප්‍රදේශයට පමණක් අදාල වන පරිද්දෙන් මෙයින් අවලංගු කරනු ලැබේ.

## "ඒ" උපලේඛනය

### පෝරමය

**බෝයගනේ ගම් ප්‍රදේශයේ ගම්සභා සභාව**

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා වල ප්‍රකාර සැපයියයුතු රථවාහන හා*/හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකරුගේ නම :————.

ඡන්දදායක කොට්ඨාශයේ අංකය සහ නම :————.

ගම :————.

| රථවාහන හා*/හෝ සතුන් පිළිබඳ විස්තරය | ගණන වචනවලින් | වෙනත් විස්තර |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ කරත්ත හැර ඕනෑම අත්දමක වාහන | | |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල | | |
| තනිගොනා බඳින බරබාග කරත්ත හෝ තිරික්කල ... | | |
| අත් කරත්ත ... ... | | |
| ජින් රික්ෂෝ කරත්ත ... | | |
| බයිසිකල් (වෙනත් විස්තර සඳහා සැපයුන කොටසේ සාදන ලද අයගේ අංකය සඳහන් කරනු) | | |
| අලි ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

ඉහත සඳහන් විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් ප්‍රකාශ කරමි.

————,
අයිතිකරුගේ අත්සන.

දිනය :————.

* නුවුවමනා වචන කපා දමනු.

## "බී" උපලේඛනය

කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ කරත්ත හැර ඕනෑම අත්දමක වාහන ... ... බෝ.ග.ස.වා.
ඕනෑම අන්දමක සෑම ගොන්දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... බෝ.ග.ස.දෙ.
සෑම තනි ගොනා බඳින කරත්තයක් සඳහා ... බෝ.ග.ස. ත.
සෑම බයිසිකලයක් සඳහා ... ... බෝ.ග. ස. බ.
සෑම අත් කරත්තයක් සඳහා ... ... බෝ.ග. ස. අ.
සෑම ජින් රික්ෂෝ කරත්තයක් සඳහා ... ... බෝ.ග. ස. ජි.

# අය වැය ලේඛන

**හොරණ නගර සභාව**

**අංක 12 (II) දරණ මුදල් රෙගුලාසිය—1958 වර්ෂයේ අයවැය ලේඛනය**

1958 වර්ෂයේ අය වැය ලේඛනයේ වැය ශීර්ෂ වෙනත් වැය ශීර්ෂ වලින් වැඩියෙන් වැයවෙන වැය ශීර්ෂ යටතේ පහත දැක්වෙන අයුරු යෙදවීමට, මෙම සභාවේ 1958 අප්‍රියෙල් මස 5 වෙනි දින පවත්වන ලද රැස්වීමේ සම්මුති අංක 3 (ඒ), 1958 සැප්තැම්බර් මස 6 වෙනි දින පවත්වන ලද රැස්වීමේ සම්මුති අංක 2 සහ 1958 ඔක්තෝබර් මස 4 වෙනි දින පවත්වන ලද රැස්වීමේ සම්මුති අංක 5 යටතේ සම්මත කෙරිනි.

| ශේෂ | | රු. | ශ. | අතිරික්ත | | රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|
| ඒ.2(බී) | ... | 500 | 0 | ඒ.2(ඇෆ්) | ... | 250 | 0 |
| ඒ.2(එච්) | ... | 800 | 0 | ඒ.2(කේ) | ... | 1,650 | 0 |
| ඒ.2(ජේ) | ... | 400 | 0 | සී.1 | ... | 30 | 0 |
| බී.2 | ... | 1,250 | 0 | සී.5 | ... | 125 | 0 |
| බී.7 | ... | 2,000 | 0 | සී.6 | ... | 425 | 0 |
| බී.8 | ... | 500 | 0 | ඊ.1(ඇන්) | ... | 430 | 0 |
| බී.12 | ... | 250 | 0 | ඊ.2(ඊ) | ... | 3,250 | 0 |
| බී.14 | ... | 1,000 | 0 | ඊ.3(ඇෆ්) | ... | 500 | 0 |
| ඊ.3(ඒ) | ... | 500 | 0 | ඊ.3(එච්) | ... | 2,500 | 0 |
| ඊ.5(ඊ) | ... | 1,999 | 15 | ඊ.7(බී) | ... | 1,999 | 15 |
| ඊ.6(ඒ) | ... | 900 | 0 | ඊ.7(එච්) | ... | 625 | 0 |
| ඊ.6(බී) | ... | 4,000 | 0 | ජී.4 | ... | 650 | 0 |
| ඊ.6(ඩී) | ... | 750 | 0 | එච්.1 | ... | 85 | 0 |
| ඇෆ්.2 | ... | 2,000 | 0 | ජේ.1(ඇෆ්) | ... | 5,950 | 0 |
| ජේ.3(ඒ) | ... | 2,500 | 0 | ජේ.2(ඩී) | ... | 500 | 0 |
| | | | | ජේ.4(ඊ) | ... | 380 | 0 |
| | | 19,349 | 15 | | | 19,349 | 15 |

නගර සභා කායඊාලය,
හොරණ, 10.10.58.

ඩබ්ලිව්. ඇම්. ෆොන්සේකා,
නගර සභාපති.

# විවිධ දැන්වීම්

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හොරොම්බාව ගම්සභා සභාව**

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත දැක්වෙන උප ලේඛනයේ නම් සඳහන් අයවලුන් විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුඬව කුරුණෑගල දිස්ත්‍රික්කයේ හොරොම්බාව ගම්සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුඬ වන්නේ අසවල් කරුණ නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

## උප ලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | | ස්ථානය | | වෙළඳාම |
|---|---|---|---|---|---|
| 1. | ඒ. ඇම්. ඊ. සුල්තාන්, ප්‍රසිද්ධ මාර්කට්, කුරුණෑගල | ... | මරක්කයාගම හේන්යාය, පොල්පිටිය, කටුපොත | ... | හරක්මස් සහ එළුමස් |
| 2. | ඇස්. ඩී. ඇම්. කාලිඩ්, හොරොම්බාව | ... | කොහොඹගහමුල වත්ත, හොරොම්බාව | ... | හරක්මස් සහ එළුමස් |
| 3. | ඇස්. පී. ඕ. මොහමමද් යූසුප්, මාර්කට්, කුලියාපිටිය | ... | දන්ගහමුල වත්ත, සියඹලාගස් කොටුව, කටුපොත | ... | හරක්මස් සහ එළුමස් |

ගම්සභා සභා කායඊාලය,
ගොඩවෙල, කටුපොත, 20.10.58.

ඒ. ටී. සෝමරත්න,
හොරොම්බාව ගම්සභා සභාවේ ප්‍රධාන තැන.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.